# මීගමුව අධ්‍යාපන කලාපය
## දෙවන වාර ඇගයීම - 2025
## නර්තනය ( දේශීය )

විභාග අංකය:...........................................

| 06 ශ්‍රේණිය | I හා II පත්‍රය | කාලය පැය 02 |
|---|---|---|

**සැලකිය යුතුයි :**

- අංක 1 සිට 20 තෙක් සියලු ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතුරෙන් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

**I කොටස**

- **ප්‍රශ්න අංක 01 – 05 තෙක් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. පා සරඹ හෙවත් දණ්ඩියමේ සරඹ ගණන වනුයේ,
    1.10කි . 2. 12 කි. 3. 03 කි. 4. 18 කි.

02. ගොඩ සරඹ හඳුන්වන තවත් නම කි.
    1. දණ්ඩියමේ සරඹ 2. ඉලංගම් සරඹ 3. අත් සරඹ 4. පා සරඹ

03. සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩය කි.
    1.ටින් බෙරය 2. පහතරට බෙරය 3. ගස්ලබු බටනලාව 4. වල් වළල්ල

04. හනුමා වන්නම ගායනා කරනු ලබන්නේ,
    1.සුළු තනි තිතට ය. 2. මැදුම් තනි තිතට ය 3.මහ තනි තිතට ය 4.මැදුම් මහ දෙතිතට ය.

05. ශාරිරික නම්‍යතා සඳහා යොදා ගන්නා චලන අභ්‍යාස ප්‍රධාන කොටස්,
    1. 02 කි. 2. 04 කි. 3. 03 කි. 4 .05 කි.

- **ප්‍රශ්න අංක 06 – 10 තෙක් හිස්තැනට සුදුසු නිවැරදි පිළිතුර පහත කොටුව තුළින් තෝරා ලියන්න.**

06. එක පඳුරෙන් ලී සයක් කපා ගෙන ...................................... කවිය කි.
07. “ ඕවාද සිප්ප දානේන “ ................................... ගාථාව කි.
08. හිරු දෙවියන් උදෙසා පූජෝපහාර දක්වනුයේ .................................... ජනතාවයි.
09. “ තත් ජිත් තොං නං තා“ මෙය ............................ ගොඩ සරඹයේ කස්තිරමයි.
10. සිංහල ගැමි නැටුමෙහි කළගෙඩි නැටුමට සමාන ද්‍රවිඩ ගැමි නැටුම ............................ නැටුමයි.

**(ගුරු නමස්කාර , සෙම්බු , පළමු , දමිළ , ලී කෙළි , දෙවන)**

- **පහත සඳහන් වගන්ති හරි වම් (√ ) ලකුණ ද, වැරදි නම් (X) ලකුණ ද යොදන්න.**

11. දේශීය නර්තන සම්ප්‍රදායන් ගණන තුන කි. ( )
12. ලී කෙළි නැටුමෙහි පෞරාණික බවට සාධකයක් ඇම්බැක්කේ දේවාලයේ දැව කැටයම් තුළින් හමුවී ඇත. ( )
13. සතුට ප්‍රදර්ශනය වීමට සිතේ සිතුවිලි බලපායි. ( )
14. වෙසක් උත්සවය පවත්වනු ලබන්නේ දෙසැම්බර් මාසයේ දී ය. ( )
15. ආධුනික නර්තන ශිල්පියෙකු මුලින් ම හදාරනු ලබන්නේ වන්නම් ය. ( )

- **ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් A කොටසට ගැළපෙන නිවැරදි පිළිතුර B කොටසින් තෝරා යා කරන්න.**

| A කොටස | B කොටස |
|---|---|
| 16. වනගතේ පිපි මල් දෙකක් මෙන් | ස්ථිතික චලන |
| 17. තෙමඟුල සිහි කිරීම | විකල්ප වාද්‍ය උපකරණ |
| 18. එකතැන දිවීම | තෛපොංගල් උත්සවය |
| 19. ටින් බෙරය | වෙසක් උත්සවය |
| 20. කෝලම් රටා | ගුරු වන්දනා කවි |

( ලකුණු 1 x 20 = 20 )

**දෙවන වාර ඇගයීම 2025 - මීගමුව අධ්‍යාපන කලාපය - නර්තනය**

**II කොටස**

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.
- පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න **03 ට පමණක්** පිළිතුරු සපයන්න.

**01. කෙටි පිළිතුරු ලියන්න.**

I. උඩරට වන්නමක කොටස් ගණන කීය ද?
II. වෙස් ඇඳුම් කට්ටලය අයත් නර්තන සම්ප්‍රදාය කුමක් ද?
III. පාසලේ දී ඔබ ඉගන ගන්නා නර්තන සම්ප්‍රදාය කුමක් ද?
IV. ගුරු ගෙදර දී පිළිපැදිය යුතු සාරධර්ම 02 ක් ලියන්න.
V. දෙවන පා සරඹ පදය ලියන්න. ( ලකුණු 2 x 5 = 10 )

02.

I. සම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ 02 ක් නම් කරන්න. ( ලකුණු 02 )
II. විකල්ප වාදන උපකරණ 03 ක් නම් කරන්න. ( ලකුණු 03 )
III. විකල්ප වාදන උපකරණයක් ඇඳ එය නිර්මාණයට යොදාගන්නා අමුද්‍රව්‍ය 03 ක් නම් කරන්න.

( ලකුණු 05 )

03.

I. හනුමා වන්නමේ බෙර පදය ලියන්න. ( ලකුණු 03 )

II. හනුමා වන්නමෙන් කියවෙන අදහස ලියන්න. ( ලකුණු 03 )

III. හනුමා වන්නමේ කවියක් ලියන්න.

( ලකුණු 04 )

**04. දේශීය නර්තන සම්ප්‍රදායන් තුන මූලික කරගෙන පහත වගුව සම්පූර්ණ කරන්න.**

| | | | |
|---|---|---|---|
| නර්තන සම්ප්‍රදායන් | උඩරට | ....................................... | ......................................... |
| ප්‍රධාන ඇඳුම් කට්ටලය | ....................................... | තෙල්මෙ ඇඳුම | ........................................... |
| ප්‍රධාන ශාන්ති කර්මය | ........................................ | ....................................... | පහන් මඩුව |
| ප්‍රචලිත ප්‍රදේශයක් බැගින් | ......................................... | ....................................... | රත්නපුරය. |
| ප්‍රධාන වාද්‍ය භාණ්ඩය | ගැටබෙරය | ........................................... | .......................................... |

( ලකුණු 1 x 10 = 10 )

05.

I. ගැමි නැටුමක ලක්ෂණ 03 ක් ලියන්න. ( ලකුණු 03 )

II. සිංහල කළ ගෙඩි නැටුමට සමාන ද්‍රවිඩ ගැමි නැටුම නම් කර කළ ගෙඩි කවියක් ලියන්න. ( ලකුණු 04 )

III. “ පාන්දරින් ඉස්කෝලෙට “ ගීතයේ පද රචනය, ගායනය සහ සංගීතය නිර්මාණය කළ ශිල්පීන් නම් කරන්න. ( ලකුණු 05 )

( ලකුණු 10 x 3 = 30 )